# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය
# මාර්ග සංවර්ධන අධිකාරිය
# ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන ව්‍යාපෘතිය සඳහා පහත සඳහන් යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසු කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | විස්තරය | ලංසු ආරක්ෂණය රු. | සුදුසු කම් | ඉංජිනේරු ඇස්තමේන්තුව (වැට් රහිත) රු. මි. | කොන්ත්‍රාත් කාලය |
|---|---|---|---|---|---|
| 01 | ගාල්ල වක්වැල්ල මාර්ගයේ කි.මී. 3+600 හි ආධාරක බැම්මක් ඉදි කිරීම (Retaining Wall) කොන්ත්‍රාත් **අංකය:** RDA/SP/G/EEG/RMTF/FLOOD/ 2024/01 | 65,000.00 | C7 සහ C6 | 6.47 | දින 90 |

02. මෙම ප්‍රසම්පාදනය ජාතික තරගකාරී ලංසු තැබීම (NCB) හරහා සිදු කෙරේ. මේ යටතේ (වැට් බදු සහ අනෙකුත් බදු හැර) සිදු කිරීමට නියමිත වැඩ වල ඇස්තමේන්තු වටිනාකම රු.මි. 50 ට අඩු බැවින් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛනයේ අංක 04/2026 (iii) හි කලාපීය මනාපය සහ CIDA ශ්‍රේණියේ මනාපය සලකනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් මහාමාර්ග විශේෂත්වය යටතේ ඉහත වගුවේ දක්වා ඇති පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) අදාළ ශ්‍රේණියේ ලියාපදිංචි වී සිටිය යුතුය.

04. මිළ ගණන් පත් ගෙවීමකින් තොරව "ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය , මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල " වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2024.05.13 දින සිට 2024.05.27 දින දක්වා පෙ.ව.09.00 සිට ප.ව 03.00 දක්වා කාලය තුළ එක් මිළ ගණන් පතක් සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 2,500.00 (සියලු බදු රහිත) ගාස්තුවක් බැගින් සහ ලිඛිත අයදුම්පතක් "ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල" වෙත ඉදිරිපත් කිරීමෙන් මිළ ගණන් ඉදිරිපත් කිරීමට අදාල අයදුම්පත් ලබාගත හැකිය.

1987 අංක 03 දරණ කොන්ත්‍රාත් සඳහා වන සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු පනත යටතේ පොදු කොන්ත්‍රාත් පිළිබඳව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ ලියාපදිංචි සහතිකය මේ සඳහා ඉදිරිපත් වන නියෝජිතයින් අතරින් ලංසු වල සාර්ථක ජයග්‍රාහකයන් සතුව තිබිය යුතුය.

06. සම්පූර්ණ කළ ලංසුව තවත් පිටපතක් ද සහිතව ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි "ගාල්ල වක්වැල්ල මාර්ගයේ කි.මී. 3+600 හි ආධාරක බැම්මක් ඉදි කිරීම (Retaining Wall) "යනුවෙන් හා කොන්ත්‍රාත් අංකය සඳහන් කර 2024.05 .28 දින ප.ව. 02.00 ට පෙර "ප්‍රධාන ඉංජිනේරු " මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල යන ලිපිනයට එවීම හෝ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදුකළ යුතුය. ප්‍රමාදවී ලැබෙන මිළ ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිළ ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ එකී මිළ ගණන් විවෘත කරනු ලැබේ.

07. 2024.08.26 දින දක්වා ලංසු වලංගු විය යුතුය. ලංසුව, ලංසු ලේඛනයේ සඳහන් කොට ඇති ප්‍රමාණයේ ලංසු ආරක්ෂණයකින් (2024.09.23දක්වා වලංගු) සමන්විත විය යුතුය. වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ප්‍රධාන ඉංජිනේරු , ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය,කොටුව, ගාල්ල වෙතින් ලබා ගත හැක. දු.ක. 091-2234891

**සභාපති**
**ප්‍රසම්පාදන කමිටුව**
**ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,**
**මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල**